රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 12/92

මගේ අංකය: 1/543 ඊ/817 ඩී/(II),
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1992 මාර්තු මස 03 වෙනි දින.

**සියලුම:** අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ආණ්ඩුවේ ඒජන්තවරුන් සහ
රාජ්‍ය සංස්ථා, රජයට අයත් ව්‍යාපාරික
ආයතන සහ රජයට අයත් සමාගම්වල
සභාපති/ නිසිබලධාරීන් වෙත.

## රාජ්‍ය අංශයේ පුහුණු වන්නන්.

රාජ්‍ය අංශයේ ආයතනවල විවිධ ක්ෂේත්‍රයන්හි පුහුණු කරනු ලබන්නන්ගේ සංඛ්‍යාව කොපමණදැයි පරීක්ෂාකර බැලීමට තීරණය කර ඇත.

02. අමුණා ඇති ආකෘතිය අනුව මෙම පුහුණුවන්නන් පිළිබඳ තොරතුරු 1992.03.25 දිනට පෙර සපයන මෙන් ඔබෙන් ඉල්ලා සිටිනු ලැබේ. එක් එක් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ආයතනය සඳහා වෙනම ආකෘති සම්පූර්ණ කළ යුතුය. තම පාලනය යටතේ ඇති උප කාර්‍යාලවලින් හෝ දිස්ත්‍රික්ක කාර්‍යාලවලින් තොරතුරු රැස්කර සසඳ බලා අදාල අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ ආයතනය යටතේ මා වෙත ඉදිරිපත් කිරීම අදාල ලේකම්වරයාගේ / දෙපාර්තමේන්තුව ප්‍රධානියාගේ / ආයතන ප්‍රධානියාගේ වගකීම වන්නේ ය.

03. මෙම වාර්තාවේ පිටපතක් ප්‍රතිපත්ති සැළසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ලේකම් වෙත දැන ගැනීම පිණිස යැවිය යුතුය.

අ.කලේ/ ( එම්.එන්.ජුනයිඩ් )
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

ලක්/-